(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 1(12).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2023 මැයි 10 බදාදා**

---

## දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා.27/2023

ගරු ජයන්ත කැටගොඩ මහතා
ගරු සංජීව එදිරිමාන්න මහතා
ගරු යදාමිණී ගුණවර්ධන මහතා
ගරු ඩී. වීරසිංහ මහතා
ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා
ගරු නීතිඥ මධුර විතානගේ මහතා
ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු කුමාරසිරි රත්නායක මහතා
ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
ගරු සම්පත් අතුකෝරල මහතා
ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා
ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
ගරු උදයකාන්ත ගුණතිලක මහතා
ගරු නිමල් ලාන්සා මහතා
ගරු එච්. එම්. එම්. හරීස් මහතා
ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා
ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය
ගරු එස්. බී. දිසානායක මහතා

ගරු (ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා,— ශ්‍රී ලංකා මුහුදු කලාපය තුළ සිදු වූ නිව් ඩයමන්ඩ් සහ එක්ස්ප්‍රස් පර්ල් යන නෞකා අනතුරු පිළිබඳව කරුණු සොයාබලා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකා මුහුදු කලාපය තුළ ඇති වූ නිව් ඩයමන්ඩ් සහ එක්ස්ප්‍රස් පර්ල් යන නෞකා අනතුරු හේතුවෙන් ශ්‍රී ලංකාවේ සමුද්‍ර පරිසර පද්ධතියට සහ ජලජ ජීවීන්ට විශාල හානියක් සිදුවී ඇති හෙයින් ද;

එම අනතුරු හේතුවෙන් ඇතිවන බලපෑම තවත් වසර ගණනාවක් යනතුරු පවතිනු ඇතැයි පරිසර විද්‍යාඥයන් විසින් මත පළ කොට ඇති හෙයින් ද;

අනතුරු සිදුවීම් දක්වා සහ අනතුරුවලින් පසුව සිදුවූ විවිධ මැදිහත්වීම් සහ අඩුපාඩු පිළිබඳව නැවත සමාජයේ දැඩි කතාබහකට ලක්ව ඇති අතර ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන මන්ත්‍රීවරයන් කිහිප දෙනෙකුම සභාව තුළ සහ ඉන් පිටතදී මෙම අනතුරු සහ නෞකා රක්ෂණ සමාගම් අතර සිදු වූ ගනුදෙනු සහ ඊට අදාළ නම් පිළිබඳ හෙළිදරව් කරන ලදුව ඒ සඳහා මාධ්‍ය මඟින් ද පුළුල් ප්‍රචාරයක් ලබා දී තිබූ හෙයින් සහ

මෙම සිදුවීම් සම්බන්ධයෙන් සත්‍ය හෙළිදරව් විය යුතු යැයි මහජන නියෝජිතයන් ලෙස අප විශ්වාස කරන හෙයින් ද;

ශ්‍රී ලංකා මුහුදු කලාපය තුළ සිදු වූ නිව් ඩයමන්ඩ් සහ එක්ස්ප්‍රස් පර්ල් යන නෞකා අනතුරු පිළිබඳව කරුණු සොයාබලා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

2. (අ) කථානායකවරයා විසින් කාරක සභාවෙහි සභාපතිවරයා සහ සාමාජික මන්ත්‍රීවරයන් පත් කළ යුතුය; සහ

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101 හි විධිවිධානයන්හි කුමක් සඳහන් වුවද, කාරක සභාව සාමාජික මන්ත්‍රීවරයන් පහළොස් දෙනෙකුගෙන් (15) සමන්විත විය යුතුය.

3. එම කාරක සභාවට —

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම තැනැත්තෙකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට ඕනෑම තැනැත්තෙකුට නියම කිරීමට ද, එකී සියලු සාක්ෂි, ලිඛිතව හෝ වාචිකව, ලබා ගැනීමට ද;

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබනු ලැබ හෝ වාරාවසාන කරනු ලැබ තිබුණ ද රැස්වීම් පවත්වාගෙන යාමට ද

බලය තිබිය යුතු ය.

4. කාරක සභාවේ වාර්තාව එහි පළමු රැස්වීමේ දින සිට මාස දෙකක (02) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කරනු ලබන එවැනි කාල පරිච්ඡේදයක් ඇතුළත දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.